## 04

# මාදුගඟ තෙත්බිමෙන් ආර්ථික සංවර්ධනයට ලැබෙන දායකත්වය: බලපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය ඇසුරින්

**එෆ්.එන්. ජෝසප්**

එෆ්.එන්. ජෝසප් කැලණිය විශ්වවිද්‍යාලයෙන් පළමු පන්තියේ සාමාර්ථයක් සහිතව භූගෝලවිද්‍යා ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය හිමිකර ගැනීමට සමත් වූ අතර ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියේ අවසන් වසර සඳහා නියමිත නිබන්ධනය ලෙස මාදු ගඟ තෙත්බිමෙන් ආර්ථික සංවර්ධනයට ලැබෙන දායකත්වය යන මාතෘකාව යටතේ සිය නිබන්ධනය ඉදිරිපත් කරන ලදී. මෙම වසරේදී භූගෝලවිද්‍යා විෂයෙන් සමාජීය විද්‍යාපති උපාධිය හැදෑරීමට බලාපොරොත්තු වන ඇය භූගෝලවිද්‍යා අධ්‍යයන අංශයෙහි තාවකාලික සහකාර කථිකාචාර්යවරියක් ලෙස කටයුතු කරයි.

**සංක්ෂේපය**

ඉතා විශාල වටිනාකමකින් යුක්ත තෙත්බිම් රාශියක් ආසියානු මහද්වීපයේ පිහිටි කුඩා රටක් වූ ශ්‍රී ලංකාව ඇසුරෙන් හඳුනාගත හැකිය. දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයෙහි පිහිටා ඇති මාදුගඟ හෙක්ටයාර 915 ක බිම් ප්‍රදේශයක් පුරා පැතිර ඇති අතර බලපිටිය හා කරන්දෙණිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකටම අයත් වේ. මාදුගඟ ආශ්‍රිත දූපත් වාසී ජනතාව මෙන් ම ගඟ අවට ජීවත්වන බොහෝ දෙනෙකු සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් තම ආර්ථික කටයුතු සඳහා මාදුගඟ දායක කරගෙන ඇත (Central Envrionment Authority, 1997). එවැනි ආර්ථික කටයුතු අතර ඉස්සන්, කකුළුවන් හා කිවුල්දිය, කරදිය මසුන් ඇල්ලීම, අහාර ලෙස හා විකිණීම සඳහා කිරල කැරැං දළු එකතු කිරීම, කොහු කර්මාන්තය ආදිය ද මෑතක සිට ක්‍රියාත්මක වන පාරිසරික සංචාරක කර්මාන්තය ද වේ. ගෝලීය සන්දර්භයෙන් සලකා බලන කල වසර 2003 හි සිට මාදුගඟ පරිසර පද්ධතිය පරිසර විද්‍යාත්මකව ඉතා ඉහළ වැදගත්කමකින් යුක්ත රැම්සාර් තෙත්බිමකි (Manusinghe, 2009). දේශීය සන්දර්භයෙන් සලකා බලන කල එය අභය භූමියක්, සංචාරක සංවර්ධන කලාපයක් වන අතර වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

මගින් කළමනාකරණය වන සුවිශේෂී කලාපයක් ද වෙයි. පාරිසරිකව මෙන් ම සමාජ ආර්ථික වශයෙන් ඉතා ඉහළ වැදගත්කමක් හිමි කරගන්නා බැවින් ද මානව ශිෂ්ටාචාරයන් හි සිටම මිනිසාගේ පැවැත්ම උදෙසා මහෝපකාරී වී ඇති හෙයින් ද තෙත්බිම් මගින් ආර්ථික සංවර්ධනය ලැබෙන දායකත්වය සුළුවෙන් තැකිය නොහැක. එබැවින් ඒ පිළිබඳ අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ. මාදුගඟ තෙත්බිම ආශ්‍රිතව ආර්ථික සංවර්ධනයට ලැබෙන දායකත්වය පිළිබඳ විමසා බැලීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය. එහිදී තෙත්බිම ආශ්‍රිතව සිදුවන ආර්ථික ක්‍රියාකාරකම් මොනවාද? ඒවායේ කාලීන හා අවකාශීය ව්‍යාප්තිය කෙබඳු ද? මෙම ආර්ථික ක්‍රියාකාරකම් නිසි කළමනාකරණයක් යටතේ සිදුවනවාද?කළමනාකරණයකින් තොරව සිදුවන විවිධ මානව ක්‍රියාවන්ගෙන් තෙත්බිමට ඇති වී තිබෙන තර්ජන මොනවාද? යන්න හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ පරමාර්ථ විය. තෙත්බිම් පරිසර පද්ධති ආශ්‍රිතව සිදුකෙරෙන ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු එක්රැස් කිරීම, දත්ත විශ්ලේෂණය හා දත්ත ඉදිරිපත් කිරීම සිදුකරනු ලැබුවේ පියවර කිහිපයකට අනුවයි. බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි තෙත්බිමට මායිම්ව පවතින ග්‍රාම නිලධාරී වසම් අතරින් වසම් පහක් නියැදිය ලෙස තෝරා ගන්නා ලදී. ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා නැවත අධ්‍යයනයට යෝග්‍ය වන පරිදි නියැදිය තෝරා ගැනීමේදී අවස්ථානුකූල නියැදීම පදනම් කරගත් ක්‍රමවත් නියැදි ක්‍රමය උපයෝගී කරගනු ලැබිණි. අධ්‍යයනයේ දී ප්‍රාථමික දත්ත රැස්කරගැනීම සඳහා යොදාගත් ප්‍රධාන ක්‍රමවේදයන් වූයේ ක්ෂේත්‍ර නිරීක්ෂණය, ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමයයි. තෙත්බිම් ආශ්‍රිතව සිදුවන ආර්ථික කටයුතු පිළිබඳවත් මාදුගඟ පිළිබඳ විවිධ තොරතුරු හා ඒ ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳවත් ප්‍රධාන වශයෙන්ම තොරතුරු එක්රැස් කරගනු ලැබුවේ පොත්පත්, සඟරා, පර්යේෂණ නිබන්ධන හා අන්තර්ජාල තොරතුරු මගිනි.

**ප්‍රමුඛ පද** : තෙත්බිම් ආශ්‍රිත ආර්ථික කටයුතු, පාරිසරික සංචාරක කර්මාන්තය,ඉස්සන් ඇල්ලීම (ජාකොටු), මත්ස්‍ය වගාව, අලංකාර මසුන් ඇල්ලීම, කොහු කර්මාන්තය

**හැඳින්වීම**

ජෛව විවිධත්වයෙන් අධික වූ, ජල විද්‍යාත්මක වශයෙන් වැදගත් වන්නා වූ සංවේදී පාරිසරික කලාපයක් වන 'තෙත්බිම්' ජීවයේ

සමතුලිතතාව මෙන් ම පරිසරයේ භෞතික සමතුලිතතාව පවත්වා ගැනීම සඳහා මහඟු කර්තව්‍යයක් ඉටුකරන සුවිශේෂ පරිසර පද්ධතියක් වශයෙන් හැඳින්විය හැකිය. මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිටම 'තෙත්බිම්' මිනිස් දිවියේ ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටුකළ බව නොරහසකි. සියවස් ගණනාවක් තිස්සේ මිනිසාගේ පැවැත්ම උදෙසා තෙත්බිම් මගින් ලැබුණු දායකත්වය අතිමහත් ය. ලෝකයට ජලය ලැබුණු දිනයේ සිට ස්වභාව ධර්මයෙන් ලැබුණු දායාදයක් සේ සැලකිය හැකි තෙත්බිම් පාරිසරික, සමාජීය, ආර්ථික යන අංශ ත්‍රිත්වයෙන් මිනිසා වෙත සපයන නිෂ්පාදන හා සේවාවන් වල වටිනාකම මිල කළ නොහැකිය.

ජලය සැපයීම, ජලය ගබඩා කිරීම, ජලය පිරිසිදු කිරීම, භූගත ජලය ප්‍රතිෂ්ඨාපනය, ගංවතුර පාලනය, කුණාටු හා වෙරළ ඛාදනය වැළැක්වීම, අවසාධිත ද්‍රව්‍ය තැන්පත් කරගැනීම, වායුගෝලීය කාබන් උරා ගැනීම, මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන හා ආරක්ෂිත ස්ථාන ලෙස ක්‍රියාකිරීම, පරිසර සෞන්දර්යය ඉහළ දැමීම, ජෛව විවිධත්වය පෝෂණය කිරීම, ඖෂධ ආහාර ලබාදීම, ඉන්ධන ලබාදීම හා ඉදිකිරීම් සඳහා අමුද්‍රව්‍ය ලබාදීම ආදී වශයෙන් තෙත්බිම්වලින් ලැබෙන ප්‍රතිලාභ රැසකි. තෙත්බිම් පාදක කර ගනිමින් ලෝකය පුරා විවිධ කර්මාන්ත රැසක් ව්‍යාප්ත වී ඇත. නිදසුන් වශයෙන් කෘෂිකාර්මික කටයුතු සංවර්ධනයට මෙන් ම ධීවර කර්මාන්තය හා සංචාරක කර්මාන්තය පවත්වාගෙන යාමට තෙත්බිම් මගින් විශාල දායකත්වයක් ලැබීම පෙන්වාදිය හැකිය. ඇන්ටාක්ටික් මහාද්වීපයේ හා උත්තරාර්ධගෝලයේ හිමෙන් වැසීගිය ධ්‍රැවාසන්න ප්‍රදේශ හැරුණු විට ලොව අන්සෑම මහද්වීපයකම තෙත්බිම් ව්‍යාප්තව තිබෙනු දැකිය හැක. ඒ අතරින් ඉතා ඉහළ වටිනාකමකින් යුක්ත තෙත්බිම් රාශියක් ආසියානු මහද්වීපයේ පිහිටි කුඩා රටක් වූ ශ්‍රී ලංකාව ඇසුරෙන් හඳුනාගත හැකිය. දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයෙහි පිහිටා ඇති මාදුගඟ ශ්‍රී ලංකාවේ තෙවන රැම්සාර් තෙත්බිම වන අතර එය රැම්සාර් තෙත්බිමක් වීමට අවශ්‍ය සියලු කරුණු සපුරාලයි. ජනප්‍රවාද වලට අනුව මාදුගඟ දූපත් හැට හතරකින් යුක්ත වන නමුත් නූතන පර්යේෂණ වාර්තාවන්ට අනුව එහි ඇති සත්‍ය දූපත් සංඛ්‍යාව 15 ක් වේ.

මාදුගඟ ආශ්‍රිත දූපත් වාසී ජනතාව මෙන් ම ගඟ අවට ජීවත්වන බොහෝ දෙනෙකු සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් තම ආර්ථික

කටයුතු සඳහා මාදුගඟ දායක කරගෙන ඇත. එවැනි ආර්ථික කටයුතු අතර ඉස්සන්, කකුළුවන් හා කිවුල්දිය, කරදිය මසුන් ඇල්ලීම, අහාර ලෙස හා විකිණීම සඳහා කිරල කැරුං දළු එකතු කිරීම, කොහු කර්මාන්තය ආදිය ද මෑතක සිට ක්‍රියාත්මක වන පාරිසරික සංචාරක කර්මාන්තය ද වේ. එබැවින් මෙම අධ්‍යයනය මඟින් තෙත්බිමෙන් ආර්ථික සංවර්ධනය ලැබෙන දායකත්වය පිළිබඳ විමසා බලන ලදී.

**අධ්‍යයන පසුබිම**

ගෝලීය සන්දර්භයෙන් සලකා බලන කල වසර 2003 හි සිට මාදුගඟ පරිසර පද්ධතිය පරිසර විද්‍යාත්මකව ඉතා ඉහළ වැදගත්කමකින් යුක්ත රැම්සාර් තෙත්බිමකි (Manusinghe, 2009). දේශීය සන්දර්භයෙන් සලකා බලන කල එය අභය භූමියක්, සංචාරක සංවර්ධන කලාපයක් වන අතර වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් කළමනාකරණය වන සුවිශේෂී කලාපයක් ද වෙයි. ඈත අතීතයේ සිටම මෙම පරිසර පද්ධතිය ප්‍රදේශයේ ජනතාව විසින් තම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා යොදාගෙන ඇත. එකී අන්තර් සබඳතාවන් හි ඉතිහාසය ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍රයන්ගෙන් හෙළි වන අතර මෑත ඉතිහාසයට අයත් පුරාවිද්‍යාත්මක නෂ්ටාවශේෂයන් දේශීය සමාජ ආර්ථික තත්ත්වයන්ගේ වෙනස්වීම් පහදා දෙයි.

කුරුඳු වගාව හා කොහු කර්මාන්තය මාදූව වැසියන්ගේ ප්‍රධාන ආදායම් මාර්ග වන අතර දැනට අවුරුදු 15 කට පමණ පෙර පවුල් 60 ක පමණ ප්‍රමාණයක් ධීවර කර්මාන්තය හා සම්බන්ධ වී ඇත. ධීවර කර්මාන්තය ප්‍රදේශයේ ජනතාවගේ ජීවනෝපායේ වැදගත් භූමිකාවක් නිරූපණය කරන අතර බොහොමයක් ජනතාව කරදිය ධීවර කර්මාන්තයට වඩා මිරිදිය ධීවර කර්මාන්තයෙහි යෙදී සිටිනු දැකිය හැක.

ඉස්සන් ඇල්ලීම ද මාදු ගඟ ආශ්‍රිත ධීවර ප්‍රජාවගේ ප්‍රධාන ජීවනෝපායකි (වික්‍රමරත්න සහ විතාන, 2007). ඉස්සන් ඇල්ලීම සඳහා මොවුන් ජාකොටු යන ක්‍රමය භාවිතා කරයි. කලපුවේ පවතින ස්වභාවික ව්‍යුහය හා එහි පවතින කිවුල් දිය තත්ත්වය නිසා ඉස්සන්, පොකිරිස්සන් හා කකුළුවන් කලපුව තුළ දැකිය හැක. කලපුවේ සිටින මත්ස්‍යයන්ටත්, ඉස්සන්, කූනිස්සන්, කකුළුවන් ආදී සතුන්ටත් ආරක්ෂිත පරිසරයක් ඉවුරු

වටා තිබෙන කඩොලාන වෘක්ෂලතා තුළින් සැපයෙයි (Central Environmental Authourity, 1997).
හික්කඩුව, බෙන්තොට හා අහුන්ගල්ල යන සංචාරක පුරවරයන්ට ආසන්නව පිහිටා ඇති හෙයින් ද ප්‍රදේශයේ වෙනත් කිසිදු ස්ථානයකට සමකළ නොහැකි දර්ශනීයත්වයකින් යුක්ත වන හෙයින් ද මාදුගඟ ප්‍රධාන සංචාරක ආකර්ෂණයක් බවට පත්ව ඇත. (Central Environmental Authority, 1997).

## අධ්‍යයන ගැටලුව

කලපුවක් ලෙස දිස්වන මාදුගඟ, කලපුවක සිටින ජෛව සමූහයකට වඩා සුවිශේෂී වූ ජෛව විවිධත්වයකට උරුකම් කියන තෙත්බිමකි. ඓතිහාසික වශයෙන් වැදගත් වන මෙහි දූපත් විශාල ගණනක් පිහිටා ඇත. එමෙන් ම ගඟ සමඟ බැඳී ඇති සමාජීය, සංස්කෘතික හා ආර්ථික රටාවන්ගේ සුවිශේෂී බවක් දැකිය හැක. එබැවින් මෙම තෙත්බිම ශ්‍රී ලංකාවේ පවතින අනෙක් තෙත්බිම් අතර වැඩි වැදගත්කමක් උසුලයි. ප්‍රදේශයේ ජනතාව අතීතයේ සිටම මාදුගඟ ආශ්‍රිතව තම ජීවනෝපාය කටයුතු පවත්වාගෙන යනු ලැබිණි. ඒ අතර ඉස්සන් ඇල්ලීමේ ජාකොටු, මිරිදිය ධීවර කර්මාන්තය හා කොහු කර්මාන්තය කැපී පෙනෙයි. එමෙන් ම විවිධ දෛනික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට තෙත්බිමෙන් හා අවට පරිසරයෙන් විශාල දායකත්වයන් ලැබුණි. අතීතයේ එකී ආර්ථික කටයුතු මෙම පරිසරයෙහි පැවැත්මට තර්ජනයක් නොවූයේ අඩු ජනසංඛ්‍යාවක් ඒ මත යැපුණු හෙයිනි. වර්තමානයේ තෙත්බිම මත යැපෙන ප්‍රමාණය වැඩි වී ඇති බැවින් ආර්ථික කටයුතු හරහා සම්පත් උපයෝජනය වන ආකාරයක් දැකිය හැක. එය මෙම පරිසර පද්ධතියෙහි පැවැත්මට අහිතකර ලෙස බලපා තිබේ.

මෑතක සිට තෙත්බිම ආශ්‍රිතව සිදුවන සංචාරක කර්මාන්තය ඇසුරෙන් ගැටලු රැසක් පැන නැඟී තිබේ. විශේෂයෙන්ම සංචාරක කර්මාන්ත ආශ්‍රිතව සිදුවන අධිබලැති එන්ජින් සහිත බෝට්ටු ධාවනය නිසා තෙත්බිම ආශ්‍රිත ජෛව පද්ධතියට විවිධ තර්ජන එල්ල වී ඇත. මෙම බෝට්ටු ධාවනය මිරිදි ධීවර කටයුතු පවත්වාගෙන යාමට බාධාවක් වී ඇත.

තෙත්බිම වෙත සිදුකරනු ලබන ගෘහස්ත කැළිකසල අපහරණය, දූපත් වල සිදුකරන අනවසර ඉදිකිරීම් කටයුතු, අපනයනය සඳහා ප්‍රමාණය ඉක්මවා සිදුකරන  මසුන් ඇල්ලීම, අනවසර ලෙස සිදුවන වැලි ගොඩ දැමීම ආදි ගැටලු ආර්ථික කටයුතු නඟා සිටුවීමට බාධාකාරී තත්ත්වයන් බවට පත්ව ඇත. විශේෂයෙන්ම මෙම ගැටලු සහගත තත්ත්වයන් හමුවේ තෙත්බිම ආශ්‍රිත ජෛව විවිධත්වය විනාශ වෙමින් පැවතීම හා පරිසර සෞන්දර්යයාත්මක බව බිඳ වැටීම ආර්ථික කටයුතු තවදුරටත් පවත්වාගෙන යාමට බාධා කාරී වේ.

**අධ්‍යයනයේ අරමුණ හා පරමාර්ථ**

මාදුගඟ තෙත්බිම ආශ්‍රිතව ආර්ථික සංවර්ධනයට ලැබෙන දායකත්වය පිළිබඳ විමසා බැලීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය. එහිදී තෙත්බිම ආශ්‍රිතව සිදුවන ආර්ථික ක්‍රියාකාරකම් මොනවාද? ඒවායේ කාලීන හා අවකාශීය ව්‍යාප්තිය කෙබඳු ද? මෙම ආර්ථික ක්‍රියාකාරකම් නිසි කළමනාකරණයක් යටතේ සිදුවනවාද?කළමනාකරණයකින් තොරව සිදුවන විවිධ මානව ක්‍රියාවන්ගෙන් තෙත්බිමට ඇති වී තිබෙන තර්ජන මොනවාද? යන්න හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ පරමාර්ථ විය.

**අධ්‍යයනයේ වැදගත්කම**

තෙතබිමක් යනු සුවිශේෂී සම්පත් පදනමක් සහිත පරිසර පද්ධතියකි. එබැවින් තෙත්බිමක ඇති සම්පත් විභවතාව, අනාගත සංවර්ධන ක්‍රියාවලිය සඳහා ප්‍රබල පිටුවහලක් වෙයි. පාරිසරිකව මෙන් ම සමාජ ආර්ථික වශයෙන් ඉතා ඉහළ වැදගත්කමක් හිමි කරගන්නා බැවින් ද මානව ශිෂ්ටාචාරයන් හි සිටම මිනිසාගේ පැවැත්ම උදෙසා මහෝපකාරී වී ඇති හෙයින් ද තෙත්බිම් මඟින් ආර්ථික සංවර්ධනය ලැබෙන දායකත්වය සුළුවෙන් තැකිය  නොහැක. මාදුගඟ, ආර්ථික සංවර්ධනයට දායක කරගත හැකි ඉහළ සම්පත් විභවතාවකින් යුක්ත තෙත්බිමකි. එබැවින් එම ප්‍රදේශයේ  ජනතාව තම ආර්ථික කටයුතු සඳහා තෙත්බිම දායක කරගෙන ඇත්තේ කිනම් ආකාරයකට දැයි විමසා බැලීම වැදගත් වෙයි. තෙත්බිම ආශ්‍රයෙන් සිදුවන ආර්ථික ක්‍රියාකාරකම් හේතුවෙන් තෙත්බිමෙහි පැවැත්මට යම්කිසි තර්ජනයක් එල්ල වී ඇත්නම්  නුදුරු අනාගයේදී එය විනාශ වී යා හැකිය. එබැවින් තෙත්බිම ආරක්ෂාකර ගනිමින් ආර්ථික කටයුතු සිදු කිරිම සඳහා තෙත්බිම ආශ්‍රිතව පවතින ආර්ථික කටයුතු පිළිබඳ අධ්‍යයනය කිරීම වැදගත් වෙයි.

### අධ්‍යයන ක්‍රමවේදය

තෙත්බිම් පරිසර පද්ධති ආශ්‍රිතව සිදුකෙරෙන ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු එක්රැස්කිරීම පියවර කීපයකින් සිදු කරනු ලැබීය. එහිදී පර්යේෂණ ක්‍රමවේදය යටතේ ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත එකතු කිරීම, දත්ත විශ්ලේෂණය සිදුකරනු ලැබුවේ ද පියවර කිහිපයකට අනුවයි.

### නියැදිය තෝරා ගැනීම


ශ්‍රී ලංකාවේ පවතින බොහොමයක් තෙත්බිම් ආශ්‍රයෙන් විවිධ ආර්ථික ක්‍රියාකාරකම් සිදු වේ. එවැනි තෙත්බිම් අතර ජනතාවගේ ජීවනෝපාය කටයුතු බොහොමයක් රැඳී පවතින සුවිශේෂී පාරිසරික තත්ත්වයන්ගෙන් යුක්ත වූ තෙත්බිමක් ලෙස මාදුගඟ තෙත්බිම හැඳින්විය හැකිය. අධ්‍යයනය සඳහා මෙම තෙත්බිම තෝරා ගැනීමට හේතු වූ මූලිකම කරුණ එයයි.

තෙත්බිම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකක ව්‍යාප්තව ඇති අතර පූර්ව නිරීක්ෂණයෙන් පසුව, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි තෙත්බිමට මායිම්ව පවතින ග්‍රාම නිලධාරී වසම් අතරින් කදිරගොන්න. (19 සී), පාතගම්ගොඩ (20 ඒ), ගල්මන්ගොඩ(21), වැලිවතුගොඩ(21 ඒ) හා මාදූව(23) යන ග්‍රාම නිලධාරී වසම් වසම් පහක් නියැදිය ලෙස තෝරා ගන්නා ලදී. මෙම ග්‍රාම නිලධාරී වසම් නියැදිය ලෙස තෝරා ගැනීමේදී ජන ඝනත්වය, තෙත්බිමට නිරාවරණය වී ඇති භූමි ප්‍රමාණය, අවකාශීය පිහිටීම යනාදී කරුණු ප්‍රධාන වශයෙන්ම සැලකිල්ලට ගනු ලැබිණි.

තෙත්බිමට මායිම් පැවතීම අධ්‍යයනය සඳහා මෙම ග්‍රාම නිලධාරී වසම් තෝරා ගැනීමට හේතු වූ විශේෂ කරුණක් විය. තෙත්බිම ආශ්‍රිතව ආර්ථික කටයුතු සිදුකරන පිරිසෙන් වැඩිප්‍රමාණයක් මෙම ග්‍රාම නිලධාරී වසම් වල ඒකරාශී වී සිටීම එයට හේතු වූ තවත් විශේෂ කරුණකි. මෙහිදී අධ්‍යයනය සඳහා වැය වන කාලය හා පිරිවැය යන සාධක වලට සාපේක්ෂව හැකි තරම් පුළුල් අවකාශීය ව්‍යාප්තියක් සහිතව අධ්‍යයන කටයුතු සිදුකිරීමට අවශ්‍ය වූ බැවින් ග්‍රාම නිලධාරී වසම් පහක් වැනි සංඛ්‍යාවක් තෝරාගනු ලැබිණි. මේ අනුව ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා නැවත අධ්‍යයනයට යෝග්‍ය වන පරිදි නියැදිය තෝරා ගැනීමේදී

අවස්ථානුකූල නියැදීම පදනම් කරගත් ක්‍රමවත් නියැදි ක්‍රමය උපයෝගී කරගනු ලැබිණි.

සිතියම අංක 1




මූලාශ්‍රයː භූගෝලවිද්‍යා තොරතුරු පද්ධතිය

**දත්ත රැස්කිරීම**

මාදුගඟ තෙත්බිම ආශ්‍රිතව ආර්ථික සංවර්ධනයට ලැබෙන දායකත්වය පළිබඳ ව විමසා බැලීම සඳහා කරන ලද මෙම අධ්‍යයනයේදී දත්ත රැස්කිරීමේ පියවර යටතේ, අවශ්‍ය කරනු ලැබූ ප්‍රාථමික දත්ත හා ද්විතීක දත්ත විවිධ ක්‍රම උපයෝගී කරගනිමින් එක්රැස්කරගනු ලැබිණි.

**ප්‍රාථමික දත්ත රැස්කරගැනීම**

අධ්‍යයනයේ දී ප්‍රාථමික දත්ත රැස්කරගැනීම සඳහා යොදාගත් ප්‍රධාන ක්‍රමවේදයන් වූයේ ක්ෂේත්‍ර නිරීක්ෂණය, ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමයයි. නියැදියෙන් තොරතුරු ලබාගැනීමේදී අධ්‍යයනය සඳහා තෝරාගත් ග්‍රාම නිලධාරී වසම්වල අහඹු ලෙසින් තෝරාගනු ලැබූ පවුල් 50 ක් මඟින් ප්‍රශ්නාවලියකින් තොරතුරු ලබා ගැනුණි. ප්‍රශ්නාවලි ක්‍රමය යටතේ තෙත්බිම ආශ්‍රිතව සිදුකෙරෙන ආර්ථික කටයුතු හඳුනාගැනීමටත්, එම ආර්ථික කටයුතු ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය නැංවීමට ලබාදෙන දායකත්වය පිළිබඳවත්, ආර්ථික කටයුතු ආශ්‍රයෙන් පැන නැගී තිබෙන ගැටලු පිළිබඳවත්, තෙත්බිම සම්බන්ධයෙන් ජනතාව දක්වන ආකල්ප පිළිබඳවත් තොරතුරු ලබා ගැනීමට හැකිවන අයුරින් සකස් කළ ප්‍රශ්නාවලියක් නියැදි සමීක්ෂිත පවුල් වෙත ඉදිරිපත් කරන ලදී. එමෙන් ම ප්‍රදේශයේ ආර්ථික කටයුතු පිළිබඳ දැනුමක් ඇති පිරිස හා අධ්‍යයනයට තොරතුරු ලබාගත හැකි ආයතන ප්‍රධානීන් සමඟ සම්මුඛ සාකච්ඡා සිදු

කරන ලදී. මෙහිදී ප්‍රදේශයේ සිදුවන සුවිශේෂී ආර්ථික කටයුතු වන ජාකොටු කර්මාන්තය පිළිබඳව හා කොහු කර්මාන්තය පිළිබඳව සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු ලබා ගැනුණි. බෝට්ටු සේවා සපයන ආයතනවල ප්‍රධානීන් සමඟ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා මඟින් සංචාරක කර්මාන්තය පිළිබඳ තොරතුරු එක්රැස් කරගැනීමට හැකිවිය. එම ක්‍රමවේදයන් මඟින් ලබාගත් තොරතුරු වඩාත් තහවුරු කරගැනීම සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණයෙහි යෙදුණි.

### ද්විතීයික දත්ත රැස්කරගැනීම

පර්යේෂණය සඳහා අවශ්‍ය වූ ද්විතීක දත්ත, මූලාශ්‍ර රැසකින් එක්රැස් කරගනු ලැබීය. තෙත්බිම් ආශ්‍රිතව සිදුවන ආර්ථික කටයුතු පිළිබඳවත් මාදුගඟ පිළිබඳ විවිධ තොරතුරු හා ඒ ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳවත් ප්‍රධාන වශයෙන්ම තොරතුරු එක්රැස් කරගනු ලැබුවේ පොත්පත්, සඟරා, පර්යේෂණ නිබන්ධන හා අන්තර්ජාල තොරතුරු මඟිනි.

### දත්ත විශ්ලේෂණය

අධ්‍යයනය සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත එක්රැස් කරගැනීමෙන් අනතුරුව එම දත්ත ප්‍රමාණාත්මක විශ්ලේෂණ ක්‍රම හා ගුණාත්මක විශ්ලේෂණ ක්‍රම යොදාගෙන විශ්ලේෂණය කරනු ලැබිණි. එහිදී ප්‍රමාණාත්මක විශ්ලේෂණය සඳහා ක්‍රමවේද කීපයක් යොදාගන්නා ලදී. එනම්, සංඛ්‍යානුකූල විද්‍යාත්මක ක්‍රමවේද, ප්‍රස්තාරික ක්‍රමවේද යන ඒවායි. ප්‍රශ්නාවලිය මඟින් ලබාගත් නියැදියේ රැකියාවල ස්වභාවය, තෙත්බිම භාවිතයට ගැනීම පිළිබඳ තොරතුරු හා සංචාරක කර්මාන්තය පිළිබඳ තොරතුරු ආදිය සංඛ්‍යානුකූල විද්‍යාත්මක ක්‍රමවේද යොදාගෙන ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කරනු ලැබීය. ප්‍රමාණාත්මකව විශ්ලේෂණය එම කරුණු ද්විතීයික මූලාශ්‍ර හා සම්මුඛ සාකච්ඡා මඟින් ලබාගත් දත්ත හා තොරතුරු ද යොදා ගනිමින් ගුණාත්මකව විශ්ලේෂණය කරනු ලැබිණි.


### නිගමන

පාරිසරික වශයෙන් මෙන් ම ඓතිහාසික වශයෙන් ද මහඟු වටිනාකමකින් යුක්ත මාදු ගඟ තෙත්බිම හා අවට පිහිටි ජනතාව අතර ඇත්තේ දැඩි බැඳීමකි. අතීතයේ සිටම තෙත්බිම අවට ජීවත්වන ජනතාව මෙන් ම තෙත්බිමෙහි දූපත් වල වෙසෙන දූපත් වාසී ජනතාව ද

විවිධාකාරයෙන් තම ජීවනෝපාය කටයුතු හා වෙනත් දෛනික කටයුතු සඳහා මාදුගඟ දායක කරගනී. ඒ අනුව ආර්ථික සංවර්ධනයට තෙත්බිමෙන් ලැබෙන දායකත්වය පිළිබඳ ප්‍රධාන වශයෙන්ම තොරතුරු ලබාගැනුණි. එමෙන් ම ජනතාවගේ ආර්ථික කටයුතු හා දෛනික කටයුතු මඟින් තෙත්බිමෙහි පැවැත්මට තර්ජනයක් වන ගැටලු සහගත තත්ත්වයන් පැනනැඟී තිබේද යන කාරණය පිළිබඳවත් තොරතුරු ලබා ගත හැකිවිය. තවදුරටත් අනවසර ලෙස ආර්ථික කටයුතු සිදුවන්නේ දැයි සොයා බැලීමටත් එහිදී අවධානය යොමුකරනු ලැබීය.

**ප්‍රස්තාර අංක 1**

**නියැදි සමීක්ෂිත පවුල්වල සේවා නියුක්තිය**




මූලාශ්‍රයඃ- නියැදි සමීක්ෂිත දත්ත 2012

සේවා නියුක්තිකයන්ගෙන් වැඩි ප්‍රමාණයක් ස්වයං රැකියාවල නියුක්ත වන බව පෙනී යයි. තෙත්බිම දායක කර ගනිමින් මිරිදිය ධීවර කර්මාන්තය, ජාකොටු හා මත්ස්‍ය වගාව යන රැකියාවල යෙදෙන්නන්ගේ එකතුව මුළු සේවා නියුක්තියෙන් 34% කි. එබැවින් තෙත්බිම අවට ජීවත් වන ජනතාවගෙන් සැලකිය යුතු ප්‍රමාණයකගේ ආදායම් මාර්ග තෙත්බිම ඇසුරු කරගෙන පවතින බව පෙනී යයි. ඉන් වැඩිම ප්‍රමාණයක් ජා කොටු කර්මාන්තයේ යෙදෙනු දක්නට හැකිය.

මාදුගඟ අවට ප්‍රදේශවල හා දූපත් වාසී ජනතාව අතර ජාකොටු ක්‍රමය මඟින් ඉස්සන් ඇල්ලීම ජීවන වෘත්තීය කරගත් පිරිස වර්තමානයේ සුළු

සංඛ්‍යාවකට සීමා වී ඇත. දළ වශයෙන් ප්‍රදේශයේ ඉස්සන් ඇල්ලීමේ යෙදෙන මුළු සංඛ්‍යාව 150 ක් පමණ වෙයි. මෙම කර්මාන්තයේ යෙදෙන පිරිස ජාකොටු හිමිකරුවන් ලෙසත් සේවකයන් ලෙසත් වෙන වෙනම වෘත්තීන්හි නියැලී සිටිනු දැකිය හැක. ජාකොටු පවත්වාගෙන යන්නන් ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා එම කාර්යයේ නියුක්ත වන අතර මේ සඳහා බට විවීමට ඔවුන්ට අවුරුද්දකට 150,000 පමණ මුදලක් වැය වෙයි.

මාදුගඟෙහි පැවති ජාකොටු අතරින් විශාල ආදායමක් උපයා ඇත්තේ 'අතෝලිය' නම් ජාකොටුවෙනි (වික්‍රමත්න සහ විතාන, 2007). අද එය අතහැර දමා ඇත. වැඩිහිටි ධීවර ප්‍රජාව පවසන ආකාරයට අතෝලිය තරම් නොමැති වුවත් සැලකිය යුතු ආදායම් ඉපයීමට 'වැල් කොටුව' සහ 'කපොල්ල කොටුව' නම් වූ ජාකොටුවලට හැකිව තිබේ. ජාකොටු සඳහා අවශ්‍ය බට පැළලි තැනීමට අවශ්‍ය වන අමු බට ගෙන එනු ලබන්නේ රත්නපුරය, පිටිගල, අමුගොඩ වැනි දුර පළාත් වලිනි. අතීතයේ ඉස්සන් ඇල්ලීම සඳහා මාදුගඟ ආශ්‍රිතව ජනප්‍රිය ක්‍රමයක් වූයේ රිටිපන්න ක්‍රමයයි. එහිදී උණ බටයේ එල්ලන ලද තෙල් පහනේ එළියට දිය මතුපිටට පැමිණෙන ඉස්සන් ඇල්ලාගැනීම සිදුකරන්නේ උණ බම්බුවලින් තනාගත් රිටක සිටයි. වර්තමානයේ මෙම ක්‍රමය මඟින් ඉස්සන් ඇල්ලීම සිදුකරනු දැකිය නොහැකිය.

අනාදිමත් කලක සිටම තෙත්බිම ආශ්‍රය කරගෙන මිරිදිය ධීවර කර්මාන්තයෙහි යෙදෙන පවුල් රැසක් මාදුගඟ අවට ප්‍රදේශය තුළ හඳුනාගත හැකිය (වික්‍රමරත්න සහ විතාන, 2007). පැසි යොදා මසුන් ඇල්ලීම මාදුගඟේ ප්‍රචලිතව ඇති එක් ක්‍රමයකි. බොහෝ කාලයක් තිස්සේ මේ සඳහා අවශ්‍ය පැසි සහ කුඩා ගෙනෙන ලද්දේ වැලිගම ප්‍රදේශයෙනි. වර්තමානයේ මෙම ක්‍රම තරමක් අඩුවෙන් භාවිතා වන අතර අවශ්‍යවන පැසි කුඩා සෑදීමට ධීවරයින් පෙළඹී සිටිති. ඒ අනුව කුඩා විවීමද ආදායම් මාර්ගයක් කරගත් පිරිසක් මෙහි වෙයි. මාදුගඟෙහි ලී වලින් කොටු සාදා මාළු අල්ලන පිරිස ද වෙති. මෙම කොටු ක්‍රමය මාළු ඇල්ලීමේ දී යොදාගන්නා සාම්ප්‍රදායික ක්‍රමයකි. මේ සඳහා සැලකිය යුතු වියදමක් ද දැරීමට සිදු වේ. මාළු කොටු සෑදීමට බට ගස් යොදාගන්නා අතර එක් මාළු කොටුවක් තැනීමට බටගස් පන්දහසක් පමණ වැය වේ.

මාදුගඟ ආරම්භ වන්නේ මුහුදේ සිට කිලෝමීටර දෙක තුනක පමණ අභ්‍යන්තරයේ සිටය. එම නිසා මත්ස්‍ය ව්‍යාප්තියට උචිතම කිවුල් දිය පරිසරයක් මාදුගඟ ආශ්‍රිතව ඇත. මිරිදිය මසුන් සහ කිවුල් දිය මසුන් වර්ග මෙන් ම කරදිය මසුන් වර්ගද මෙහිදී හඳුනාගත හැකිය. වර්තමානයේ මිරිදිය මසුන්ට ඉතා හොඳ වෙළඳ පොළක් පවතින බව 82% කගේ අදහස විය. මාදුගඟෙන් අල්ලාගනු ලබන මසුන් අතර සුදු අගුළුවා, පත්අංකුට්ටා, කටිල්ලා, ඉඟුරු පරවා, කපුහෙන්දා, කොරළියා, මඟුරා, තිලාපියා, තෙප්පිලි, ලූලා, කලු ආඳා, යොන්නා, උද්දා, ඉලන්තියා සහ වැලිගොව්වා වැනි මත්ස්‍යයන් මාදු ගඟෙන් අල්ලා ගැනේ.
වර්තමානයේ ධීවර කර්මාන්තයේ යෙදෙන බොහෝ පිරිස් සතුව ෆයිබර් ඔරු පවතී. එමෙන් ම නයිලෝන් හෝ තංගුස් නූලෙන් වියන ලද දැල් ද ඒ සඳහා භාවිතා කරනු ලබයි. මීට අමතරව මාළු බෑම, මස් අතු දැමීම හා කකුළුවන් ඇල්ලීමට උගුල් ඇටවීම සිදුකරනු දැකිය හැක. මාදු ගඟෙහි මාළු අල්ලනු ලබන මුළු ධීවරයින් සංඛ්‍යාව 110 ක් පමණ වෙයි.

නියැදි සමීක්ෂිත පවුල් අතරින් මත්ස්‍ය වගාවෙහි යෙදෙන එක් පුද්ගලයෙක් විය. ගඟ මධ්‍යයෙහි ඔහු විසින් මත්ස්‍යය ගොවිපළක් පවත්වාගෙන යයි. ඊට අමතරව රජයට අයත් තවත් මත්ස්‍යය ගොවිපළක් එම ස්ථානයේම තිබේ. ඔහු මෙම ගොවිපළෙහි කටයුතු වල ද නිරත වී සිටියි. එම මත්ස්‍ය ගොවිපළෙන් ලැබෙන ආදායම රජයට හිමිවන අතර ගොවිපළෙහි කටයුතු පවත්වාගෙන යාම සඳහා ඔහුට වැටුපක් ලැබෙන බව සම්මුඛ සාකච්ජා වලදී හෙළිවිය. මෙම ගොවිපළෙහි ආහාරයට ගන්නා මත්ස්‍ය වර්ගයන්ට අමතරව අලංකරණාත්මක මත්ස්‍යයන් ද වගා කරනු ලබයි. සම්මුඛ සාකච්ජා මඟින් අනාවරනව වූ තොරතුරු අනුව අධ්‍යයන ප්‍රදේශය තුළ 'අපනයනය සඳහා අලංකරණාත්මක මසුන් ඇල්ලීම' තම ජීවනෝපාය කරගත් පුද්ගලයින් ද වෙයි. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම අල්ලාගනු ලබන්නේ Mono-*Monodactylus argenteus*සහSpotted scat-*Scatophagus argus*යන මත්ස්‍යයින් වර්ග දෙකයි (IUCN, 2002).

මාදුගඟ අවට ජීවත්වන ජනතාව අතර පැතිර පවතින තවත් සුවිශේෂී කර්මාන්තයක් වන්නේ කොහු කර්මාන්තයයි. මේ ආශ්‍රිතව නිෂ්පාදනය කරන ලණු, පාපිස්නා, කොසු, ඉදල්, බුමුතුරුණු සහ විසිතුරු කොහු

නිර්මාණ සඳහා ඉතා හොඳ දේශීය වෙළඳපොළක් පවතින බව මෙම කර්මාන්තයේ යෙදෙන වැඩිදෙනෙකුගේ අදහසයි. ඊට අමතරව මෙම නිෂ්පාදන විදේශීය සංචාරකයන්ට අලෙවි කෙරේ. අතීතයේ කොහු ලබාගැනීම සඳහා පොල්ලෙලි පදම් කිරීම සඳහා මාදුගඟ යොදා ගැනුණි. මේ සම්බන්ධ තොරතුරු විමසා බැලීමේදී පාතගම්ගොඩ ග්‍රාම නිලධාරී වසමෙහි කොහු මොල් හිමියන් කිහිපදෙනෙක් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා මගින් හෙළිවූයේ වර්තමානයේ පොල්ලෙලි පදම් කිරීම සඳහා තෙත්බිම භාවිතා නොකරන බවයි. එහිදී ඔවුන් පෙන්වාදෙන ආකාරයට පොල්ලෙලි වලට වතුර ඉසීමෙන් පසු කොහු අඹරන යන්ත්‍රයට දමා කොහු ලබාගන්නා බවයි. එමෙන් ම මෙවැනි එක් කොහු මෝලකින් මාසයකට කොහු මිලට ගන්නා පුද්ගලයින් ප්‍රමාණය දළ වශයෙන් 50 ක් පමණ වෙයි. මේ අනුව ගෘහාශ්‍රිතව සිදුකරන මෙම කර්මාන්තයේ යෙදෙන පිරිසෙන් වර්තමානයේ පොල්ලෙලි පදම් කිරීම සඳහා තෙත්බිම යොදාගන්නේ ඉතාම සුළු පිරිසකි. එසේ වුවද ප්‍රදේශයේ ජනතාවගෙන් සැලකිය යුතු පිරිසක් අද ද මෙම කර්මාන්තයේ යෙදී සිටින්නේ තෙත්බිම ඇසුරු කරගනිමින් අතීතයේ ප්‍රදේශය පුරා කොහු කර්මාන්තය පැතිර ගිය බැවිනි.

**තෙත්බිම භාවිතයට ගැනීම පිළිබඳ තොරතුරු හා එයින් ආර්ථිකයට දක්වන දායකත්වය**

මාදුගඟ හා ඒ ආශ්‍රිත භූමිය ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් කැපී පෙනෙන ලක්ෂණය වන්නේ 38% ක ප්‍රමාණයක් සත්ත්ව නිෂ්පාදන භාවිතයට ගැනීමයි. මොවුන් ඉස්සන්, කකුළුවන් හා මත්ස්‍යයන් අලෙවි කිරීම සිදුකරයි. ඊට අමතරව ආහාරය සඳහා පමණක් මත්ස්‍යයන් අල්ලාගනු ලබන පිරිස ද වේ. ගඟ අවට පවතින ශාක වර්ග භාවිතයට ගනු ලබන්නේ 16% ක් පමණ පිරිසකි. විවිධ පලා වර්ග ආහාර සඳහා ද පානය සඳහා කිරල ගෙඩි ද විවිධ ශාක වර්ග ඖෂධ ලෙස ද විවිධ පන් වර්ග බෑග්, මලු හා පැදුරු නිෂ්පාදනය සඳහා ද විවිධ කාර්යයන් සඳහා කඩොලාන ශාක ද යොදාගන්නා පිරිස ඒ අතර වෙයි. කෘමි හානිවලට ඔරොත්තු දෙන මණ්ඩ, කඩොල්, කඳුරු, කිරල වැනි ශාක ද ගිංපොල් අතු ද ඉදිකිරීම් සඳහා යොදා ගැනෙයි (වික්‍රමරත්න සහ විතාන, 2007). වෙස් මුහුණු කර්මාන්තයට ඉතාම සුදුසු ගොන් කඳුරු (Cerbera Manghas) ශාක මාදුගඟ ආශ්‍රිතව බහුලව දැකිය හැකිය. එම ශාක යොදාගනිමින් කෙරෙන මෙම වෙස්මුහුණු කර්මාන්තය විදේශික

සංචාරකයන් ඉලක්ක කරගෙන සිදු කරන බැවින් වර්තමානයේ ආර්ථික වශයෙන් වැදගත් කර්මාන්තයක් බවට පත්ව තිබේ. කඩොලාන ශාක දර වශයෙන් භාවිතයට ගන්නා අය ද සුළු වශයෙන් දැකිය හැක. මස් අතු දැමීම සඳහා ද ධීවර කර්මාන්තයේ යෙදෙන්නන් කඩොලාන ශාකවල අතු භාවිතා කරයි. මාදුගඟ ආශ්‍රිත කඩොලාන ශාක කැපීම තහනම් කර ඇති බැවින් ප්‍රදේශයේ ජනතාව මෙම ශාක ප්‍රයෝජනයට ගනු ලබන්නේ ඉතාම සුළු වශයෙන් බව 90% කගේ අදහස විය. (IUCN, 2002).

**සංචාරක කර්මාන්තය හා එමගින් ආර්ථිකයට සිදුවන ප්‍රයෝජ්‍යතාව**

සංචාරක කර්මාන්තය සම්බන්ධ තොරතුරු ලබා ගැනීමේදි බෝට්ටු සේවා සපයන ආයතන වල ප්‍රධානීන්ගෙන් ද වෘත්තීයමය වශයෙන් බෝට්ටු පදවන්නන්ගෙන් ද සම්මුඛ සාකච්ජා හා ප්‍රශ්නාවලිය මඟින් තොරතුරු එක්රැස් කරගනු ලැබිණි. එම තොරතුරු අනුව දිනකට මාදුගඟ නැරඹීමට පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව දළ වශයෙන් 100 ක් පමණ වෙයි. මෙම ප්‍රමාණය අවුරුද්දේ සංචාරකයන් වැඩි වශයෙන්ම පැමිණෙන නොවැම්බර්, දෙසැම්බර් හා ජනවාරි යන මාසවල 150 ක් වැනි සංඛ්‍යාවක් දක්වා ඉහළ යයි. සාමාන්‍යයෙන් දිනකට ධාවනය වන සංචාරක බෝට්ටු සංඛ්‍යාව 30-40 ත් අතර ප්‍රමාණයක් වෙයි.

අධ්‍යයනයේ දී අනාවරණය වු කරුණු අනුව පැමිණෙන සංචාරකයින් ප්‍රමාණය පෙරට වඩා වැඩි වී ඇත. සංචාරක බෝට්ටුවක් සඳහා දළ වශයෙන් විදේශක සංචාරකයන්ගෙන් අයකරනු ලබන මුදල රු.3000-රු.4000 ක් පමණ වෙයි. මාදු ගඟ නැරඹීම සඳහා වැඩි වශයෙන්ම පැමිණෙන්නේ විදේශීය සංචාරකයන් බව තොරතුරු ලබාදුන් සියල්ලන්ගේම අදහස විය. එමෙන්ම සති අග දිනවලදී දේශීය සංචාරකයන්ගේ පැමිණීම වැඩි බවත් ඔවුන් විසින් පෙන්වා දුණි. දේශීය සංචාරකයන්ගෙන් බෝට්ටුවකට අයකරනු ලබන්නේ රු.2000 ක් වැනි මුදලකි. සංචාරකයන්ට මග පෙන්වන්නෙක් (Tourist Guide) අය කරන මුදල දළ වශයෙන් රු.3000 හෝ රු.4000 ක් වෙයි. විශේෂයෙන්ම මෙවැනි මුදලක් අය කරනු ලබන්නේ විදේශීය සංචාරකයින්ගෙනි. මාදුගඟ නැරඹීමට එන සංචාරකයන්ට බෝට්ටු සේවා සපයන ආයතන 7 ක් බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා තිබේ. එනම්, මැන්ග්‍රෝ රිවර් සෆාරි, ගඟබඩ අසිරිය, උදුල් බෝට් සෆාරි, ජයන්ත බෝට් සෆාරි, නිල්වලා බෝට් සෆාරි, ප්‍රියන්ත බෝට් සෆාරි සහ ටිස්සි

බෝට් සෆාරි යන ඒවායි. මෙම සියලුම ආයතන වල පවතින මුළු බෝට්ටු සංඛ්‍යාව 100 ක් පමණ වෙයි. ඒ අතර ආසන සහිත විශාල බෝට්ටු 15ක් පමණ පවතී. දේශීය සංචාරකයකුගෙන් ආසනයකට අය කරනු ලබන මුදල රු.250 ක් වන අතර විදේශීය සංචාරකයකුගෙන් අයකරන මුදල රු.850 ක් වේ. ඒ අනුව ආසන සහිත බෝට්ටුවකින් එක් සංචාරයකදී දේශීය සංචාරකයන්ගෙන් රු.5000 ක පමණ මුදලක් ද විදේශීය සංචාරකයන්ගෙන් රු.17000 ක පමණ මුදලක් ද ලබාගත හැකිය. ඉහත සඳහන් කළ බෝට්ටු සේවා ආයතන සියල්ලෙහිම සේවයේ නියුතු සංඛ්‍යාව 120 ක් පමණ වේ. එම සේවකයන්ට මෙම ආයතන මගින් වැටුප් ගෙවනු ලබයි. මේ සේවකයන්ගෙන් 84% ක්ම රු.500 කට වැඩි දෛනික ආදායමක් ලබන අතර 16% ක් රු.200 ක පමණ දෛනික ආදායමක් ලබයි. මග පෙන්වීම සඳහා විදේශීය සංචාරකයින්ගෙන් ලැබෙන මුදල් ද ඇතුළුව මොවුන්ගේ මාසික ආදායම දළ වශයෙන් රු.15000 ත් රු.20000 ත් අතර ප්‍රමාණයක් වේ. බෝට්ටු සේවා ආයතනයක දෛනික ආදායම රු.25000 ට වැඩිය. මීට අමතරව ධීවර කර්මාන්තයෙහි යෙදෙන බෝට්ටු හිමියන් ද මාදුගඟ නැරඹීම සඳහා දේශීය සංචාකරයන් රැගෙන යයි. එබැවින් එවැනි පුද්ගලයන්ට තම මූලික ආදායම් මාර්ගයට අමතරව මුදල් උපයාගැනීමට අවස්ථාව සැලසී තිබේ.

මාදුගඟ ආශ්‍රිතව පවතින දූපත්වල සංචාරකයින්ට විවේක ගැනීමට හා ආහාර සැපයීමට ස්ථාන සකස් කර තිබේ. එම ස්ථානවලට ද සංචාරක කර්මාන්තය හරහා සැලකිය යුතු ආදායමක් ලැබේ. මහලදූව දූපතෙහි ඉදිකර ඇති 'මාදුගංගා විලා' සංචාරක හෝටලය මගින් ලබාගන්නා ආදායම ගොඩබිම පවතින එවැනි සංචාරක හෝටලයකින් ලබාගන්නා ආදායම මෙන් දෙගුණයකට වඩා වැඩිය. ජලයෙන් වටවූ ආකර්ෂණීය පරිසරයත් දූපතක පිහිටා තිබීමත් නිසා මෙහි නවාතැන් ගැනීමට සංචාරකයින් වැඩි කැමත්තක් දක්වයි. බෝට්ටු සවාරි අවසානයේ ගඟට මායිම්ව පවතින උද්‍යානයේ හෝ ගඟෙහි පාවෙන භෝජනශාලාවල ඉතා රසවත් ආහාර ගැනීමට සංචාරකයන්ට අවස්ථාව ලැබෙයි. මෙහි 'නිරෝගා' නම් වූ ආයුර්වේද හෝටලයක් ද පවතී. එය ඖෂධ හා පළතුරු උයනකින් ද සමන්විත පරිසර හිතකාමී හෝටලයක් වේ. මෙමගින් ආයුර්වේද ප්‍රතිකාර, වෛද්‍ය චිකිත්සා, යෝගා, ආයුර්වේද පෝෂණමය තොරතුරු ආදී සේවාවන් රැසක් සංචාරකයින් වෙත සපයයි.

මීට අමතරව මාදු ගඟෙහි එක් කුඩා දූපතක වෙසෙන පවුලක් කුරුඳු තලන ආකාරය විදේශීය සංචාරකයින්ට පෙන්වීම මගින් සැලකිය යුතු ආදායමක් උපයා ගනී. මෙම දූපතෙහි වාසය කරන්නේ මොවුන් පමණි. දූපත පුරාම කුරුඳු වගාකර ඇති අතර සංචාරකයින් කුරුඳු තලන ආකාරය දැකගැනීම සඳහා අනිවාර්යයෙන්ම මේ දූපතට ගොඩවේ. ගඟ මධ්‍යයෙහි පවතින මත්ස්‍ය ගොවිපළ නැරඹීමට ද සංචාරකයින් අමතක නොකරයි. සංචාරකයින්ගෙන් මත්ස්‍ය ගොවිපළභාරව කටයුතු කරන පුද්ගලයාට මුදල් ලැබේ. එය සංචාරක කර්මාන්තය නිසා ඔහුට ලැබෙන අමතර ආදායම් මාර්ගයකි. මෙම මත්ස්‍යය ගොවිපළ නැරඹීමට පැමිණෙන විදේශීය සංචාරකයන් මත්ස්‍යයන් මගින් තමා දෙපා සම්භාහනයට ලක් කරගැනීම සිදුකරන අවස්ථා ද දැකගත හැකිය. එහිදි කුඩා මත්ස්‍යය කොටු වටා අසුන් ගෙන තම දෙපා කොටු තුළ බහාගෙන සිටිනු ලැබේ.

මාදුගඟ ආශ්‍රිතව මේ ආකාරයට සංචාරක කර්මාන්තය වර්ධනය වී ඇත්තේ මෙම පරිසරයෙහි පවතින දර්ශනීය බව හේතුවෙනි. විශේෂයෙන්ම විශාල දූපත් සංඛ්‍යාවක් පිහිටීම සංචාරක ආකර්ෂණයට තුඩුදුන් කරුණකි. මෙම දූපත් වල සංස්කෘතික වටිනාමකින් යුක්ත ඓතිහාසික ස්ථාන පිහිටා තිබීම එයට හේතු වූ තවත් කරුණකි. කොත්දූව දූපතේ පිහිටා ඇති 'කොත්දූව රජමහා විහාරය' ශතවර්ෂ ගණනාවක් පැරණි බෞද්ධ පන්සලකි. මාදූව දූපතෙහිද බෞද්ධ පන්සල් දෙකක් පවතී. ඉන් එකක් වන වික්‍රසිංහාරාමය පන්සල ඓතිහාසික වශයෙන් වැදගත් වේ. මෙහි ඇති බෝධි වෘක්ෂය අනුරාධපුරයට වැඩම කළ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දෙතිස් ඵලරුක බෝධිවලින් එකක් යැයි විශ්වාස කරයි.

ජෛව විවිධත්වයෙන් ඉතා පොහොසත් මාදුගඟ තෙත්බිම ආශ්‍රිතව විවිධ වර්ගයේ මත්ස්‍යයන්, උභය ජීවීන්, උරගයින්, පක්ෂීන්, ක්ෂීරපායීන්, සමනලයින්, ගොළුබෙල්ලන් ආදී සත්ත්වයන් දැකිය හැක. මාදුගඟ ආශ්‍රිතව පවතින්නේ ඉතාම අඩුවෙන් වෙනස්වීම්වලට ලක්ව ඇති ලංකාවේ පැරණිම කඩොලාන වනාන්තර වේ. එබැවින් දේශීය මෙන් ම විදේශීය සංචාරකයින් බොහෝ පිරිසක් මාදුගඟ නැරඹීමට නිතිපතා පැමිණෙයි. මොවුන් අතර හුදු විනෝදාස්වාදය සඳහා පැමිණෙන්නන් මෙන් ම කඩොලාන අධ්‍යයනය, පක්ෂි නිරීක්ෂණයට මෙන් ම තෙත්බිම් පරිසර පද්ධති අධ්‍යයනය කිරීමට පැමිණෙන පාසල්,

විශ්වවිද්‍යාල සිසුන් මෙන් ම දෙස් විදෙස් විද්වතුන් ද බහුලව වේ. මේ අනුව සංචාරක කටයුතු මඟින් ආර්ථිකමය වශයෙන් ලැබෙන ප්‍රතිලාභ බොහෝය.

**ආශ්‍රෙය ග්‍රන්ථ**


අමරසිංහ, එම්. (2004). *ලෝකයේ පුරාණ ශිෂ්ටාචාර ඊජිප්තුව (නයිල් නිම්න අධිරාජ්‍ය)*, සමන්ති පොත් ප්‍රකාශකයෝ.

ඒකනායක, ඒ. (2006). *මෙසපොටේමියානු ශිෂ්ටාචාරය.* ඇස් ගොඩගේ සහෝදරයෝ.

චාමින්ද, එස්. (1991). *ජගත් ශිෂ්ටාචාර.* චාමර මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ.

ධනපාල, එච්. ඒ. (2010). *පරිසර විනාශය හා සංරක්ෂණය.* සරසවි ප්‍රකාශකයෝ.

ධනපාල, ඒ. එච්. සහ කුමාරගමගේ, එල්. (2006). *පාරිසරික භූගෝල විද්‍යාව, පරිසර පද්ධති.* කර්තෘ ප්‍රකාශනයකි.

පලිහපිටිය, ආර්. ඒ. සහ දි සිල්වා, ඩබ්. (2001). *මාදුගඟ.* සවිය සංවර්ධන පදනම.

ප්‍රනාන්දු, එස්. එල්. ජේ. (2003). *තෙත්බිම්වල ක්‍රියාවලිය හා ඵලදායිතාව (භූගෝල විද්‍යාත්මක විමර්ශනයක්)* ,විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

මධ්‍යම පරිසර අධිකාරිය. (1997). *තෙත්බිම් ස්ථානීය වාර්තාව.* සීමාසහිත ගුණරත්න ඕෆ්සෙට්.

මධ්‍යම පරිසර අධිකාරිය. (1997). *තෙත්බිම් ස්ථානීය වාර්තාව සහ කළමනාකරණ සැලැස්ම බූන්දල ජාතික වනෝද්‍යානය.*

මධ්‍යම පරිසර අධිකාරිය සහ පරිසර අමාත්‍යාංශය. (1998). *තෙත්බිම් අසිරිය.*

ලියනගේ, එස්. (1997). *ශ්‍රී ලංකාවේ තඩොලාන ශාක ප්‍රජාව.* වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

වික්‍රමරත්න, එම්. සහ නිරෝෂණී, එල. (2006). *ශ්‍රී ලංකාවේ තෙත්බිම්; පරිසර විද්‍යාත්මක සහ සෞන්දරයය ප්‍රවේශය.* හරිත තොරතුරු කේන්ද්‍රය සහ ශ්‍රී ලංකා පාරිසරික ජනමාධ්‍යවේදී පර්ෂදයේ ප්‍රකාශනයකි.

වික්‍රමරත්න, ඩී සහ වරුෂ, වී. එච්. (2007). *මාදුගඟ ශ්‍රී ලංකාවේ සුන්දරම රැම්සාර් තෙත්බිම.* කර්තෘ ප්‍රකාශනයකි.

විජයරත්න, එම්. ජේ. එස්. (1995). *පරිසර විද්‍යාව.* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

Central Enviromental Authority and Euroconsult. (1997). *Wetland site report and conservation management plan Maduganga Estuary.* Printed at Gunaratne offset Ltd,Colombo,Srilanka.

IUCN. Edward, B. B., Mike, A. & Duncun, K. (1997).*Economic Valuation of Wetland.*Ramsar Convention Bureau, Gland, Switzerland.

IUCN. (2002).*An Assessment of the Status of Biodiversity in the Maduganga Mangrove Estuary.* IUCN-Sri Lanka.

Manusinghe, P. (2009). Changing Socio Economic Pattern and Conservation of Maduganga Wetland. Retrieved from http://environmentlanka.com/blog/2010/changing-socio-economic-pattern-and-conservation-of-maduganga-wetland/